**දේපල මිළදී ගැනීමේදී කොළඹ නගරයේ ඇති වැදගත් කම.**

රටක දියුණුව ඉතා ඉක්මනින්ම ළගා වෙනේ එහි අගනුවරට බව සැම දෙනාම ඉතා හොදින් දන්නා කරුණක්. අළුත් තාක්ෂණය, වෙනස් ආකාරයේ ජීවන රටා, ඉහළ පහසුකම් ආදී බොහෝ වාසි අගනුවරට සම්පව ජීවත් විම නිසා අත් වෙනවා. ඒ හේතුව නිසා දේපල මිළදී ගැනීමේදී එය අගනුවරට කොයිතරම් දුරකින් පිහිටා ඇතිද යන සාධකය ඉතාමත් වැදගත්. John Keells Properties හි දේපල සංවර්ධන හා කළමණාකරණ අංශ ප්‍රධානී නයන මාවිල්මඩ මහතා තම වසර ගණනාවක අත්දැකීම් සමග මේ පිළිබද තම අදහස් දක්වමින් ශ්‍රි ලංකාවේ තත්වය කතාබහට ලක් කළා. ලංකාවේ අගනුවර ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වුණත් මාවිල්මඩ මහතා තම අදහස් ප්‍රකාශ කිරිමේදී වඩාත්ම අවධානය යොමු කරන්නේ ශ්‍රී ලංකාවේ වාණිජ ක්ෂේත්‍රයේ හදවත බදු කොළඹ නගරයටයි.

කොළඹ නගරයේ ඇති කැපී පෙනෙන ලක්ෂණයක් ලෙස ඉක්මනින් සුබවාදී ලෙස වෙනස්වෙන සුලු බව හදුන්වන්නට හැකියි. රටට පැමිණෙන ඕනෑම නව අදහසක් හෝ තාක්ෂණික දියුණුවක් බොහෝ වෙලාවට මුලින්ම ක්‍රියාත්මක වෙන්නේ කොළඹ නගර සීමාවේ වීම විශේෂත්වයක්. මාවිල්මඩ මහතා ගේ අදහසට අනුව නම් " රටේ දියුණුවේ කේන්ද්‍රස්ථානය " ලෙස කොළඹ නගරයට ප්‍රධාන ස්ථානයක් හිමි වෙනවා. තවදුරටත් ඔහු කියා සිටිනවා මේ තත්වය තවත් වසර ගණනාවකට වෙනස් නොවීම ගැන ඔහු විශ්වාස කරන බව. මේ නිසා ඉතා ඉක්මනින් අනාගතයට හැඩ ගැසෙන කොළඹ නගරයෙන් දේපලක් හිමි කර ගැනීම ඉතාම වාසිදායක තත්වයක් ලෙස සැලකීම ඉතාමත් දුරදක්නා තීරණයක් ලෙස සැලකිය හැකියි.

මාවිල්මඩ මහතා සමග සිදු කළ සාකච්ඡාවේදී ඉස්මතු වූ තවත් කාරණයක් ලෙස කොළඹ නගරය අවට ඇති අධ්‍යාපන , රැකියා හා විනෝදාස්වාද අවස්ථා දක්වන්නට හැකියි. ලංකාවේ ප්‍රමුඛ පෙළේ පාසල් රැසක් කොළඹ නගරය අවට පිහිටා තිබෙනවා පමණක් නොවෙයි රාජ්‍ය හා පෞද්ගලික විශ්වවිද්‍යාල අතින්ද මේ නගරයේ අඩුවක් නැහැ. ඊට අමතරව රැකියා සදහා ඉල්ලුම් කළ හැකි රාජ්‍ය හා පෞද්ගලික ආයතන කොළඹ නගරයේ ඉතාමත් ම බහුලයි. ඒ සමගම නයන මාවිල්මඩ මහතා තවත් සමාජ අවශ්‍යතාවක් පිළිබද කතාබහ කරනවා. එය විනෝදාස්වාදය ලෙස හැදින්විය හැකියි. කොළඹ නගරය පුරා පවතින සිනමාහල්, සතුටු උයන්, විවිධාකාර අවන්හල් ආදී දේවලින් එය සපිරෙනවා. මේ සියලු අවස්ථාවන් ඉතා පහසුවෙන් ළගා කර ගත හැකි නිසා කොළඹ නගරය දේපල මිළදී ගැනීමේදී වැඩි ලාභයන් හා වාසි අත්වෙන පිහිටීමක්.

ව්‍යාපාර හා ආයෝජනයට කැමැත්තක් දක්වන පුද්ගලයන්ටත් කොළඹ නගරයේ පදිංචිය බොහෝ වාසිදායකයි. යටිතල පහසුකම් අතින්ද මේ නගරය ඉහළම මට්ටමක පවතින නිසා කාලය ඉතිරි වෙන පරිදි තම කටයුතු ඉටු කර ගැනීමටද හැකියාව තිබෙනවා. ජාත්‍යන්තර ගුවන් තොටුපළ හා වරාය නිසා විදේශයන් සමග සෘජුවම සම්බන්ධ වීමටත් කොළඹ නගරය ඉතාම සුදුසු බව සලකන්නට හැකියි.

මිට අමතරව John Keells Properties ආයතනයේ දේපල සංවර්ධන හා කළමණාකාර අංශ ප්‍රධානී නයන මාවිල්මඩ මහතා දේපල මිළදී ගැනීමේදී කොළඹ නගරයේ ඇති වැදගත් කම පිළබද දැක්වූ සම්පූර්ණ අදහස් දැනගැනීමට John Keells Properties

YouTube නාලිකාව ට පිවිස පහත විඩියෝව නරඹන්න


TRI-ZEN
A METROPOLITAN SPACE BY
JOHN KEELLS PROPERTIES
JOHN KEELLS
PROPERTIES